# 4. තිරසර පෙමින් යුත් දෙවිඳාණෝ

**දෙව් පියාණන් වහන්සේගේ ස්ථිර ප්‍රේමය කෙරෙහි විශ්වාසය තබමින් දේව ගරුබිය ඇති ජීවිතයක් ගොඩනගා ගැනීම මෙම පාඩමෙන් අධ්‍යයනය කිරීමට අපේක්ෂිත ය.**

## ගීතාවලිය 103:1-17

ගීතාවලියේ 103 වන ගීතිකාව තුළ දෙවියන් වහන්සේගේ ස්ථිර ප්‍රේමය පහත සඳහන් ආකාරයට විස්තර කෙරේ.

? සියලු රෝගවලින් ආරක්ෂා කොට යහපත් දෙයින් තෘප්තියට පමුණුවන ප්‍රේමයකි.

? පාපයෙන් ගලවා ප්‍රේමයෙන් හා දයාවෙන් සරසන ප්‍රේමයකි.

? අනුකම්පාවෙන් හා දයාවෙන් පූර්ව කරුණාව දක්වන ප්‍රේමයකි.

? පියකු සේ වරදට කමා වන ස්ථිර ප්‍රේමයකි.

? සදාකාලික ප්‍රේමයකි.

දෙවියන් වහන්සේගේ මෙම ප්‍රේමයට සමාන කිරීමට මිහිපිට කිසිවක් නොමැත. එතුමාගේ ස්ථිර ප්‍රේමය සැම විට ම අප යහමඟට යොමු කරන සේක. නපුරු ක්‍රියාවන්ගෙන් අප දුරස් කර එයින් අප මුදවා ගනී.

දෙවියන් වහන්සේගේ ස්ථිර ප්‍රේමය තුළ අප වෙත ලැබෙන වරප්‍රසාද මොනවාදැයි සොයා බලමු.



දෙවි පියාණන්ගේ ස්ථිර ප්‍රේමය තුළ ඔබ ලබන වරප්‍රසාද තුළින් අන් අයගේ ජීවිත ගොඩනගා ගැනීමට ක්‍රියා කිරීම වැදගත් වේ.

මෙලොව ජීවත් වන සෑම කෙනෙක් ම පවුලකට අයත් වේ. පවුලේ නිර්මාතෘවරයාණන් වන්නේ දෙවියන් වහන්සේ ය. පවුල තුළින් සමාජයක් නිර්මාණය වෙයි.

පවුලක් හා සමාජයක් වශයෙන් අප එකට ජීවත් වීමේ දී ලැබෙන විශේෂ වටිනාකම් ඇත.

ආදරය

රැකවරණය

පරිත්‍යාගය

ධෛර්යවත් කිරීම

සමාව දීම හා ලැබීම්

මෙලෙස අප පවුලක් ලෙස එකට ජීවත් වීමේ දී අප අතර පවතින වටිනාකම් උසස් සමාජයක් නිර්මාණය කිරීමට ඉවහල් වේ. දෙවියන් වහන්සේගේ ස්ථිර ප්‍රේමය තුළින් එම වටිනාකම් අප වෙත උරුම වී තිබේ.

දෙවියන් වහන්සේගේ තිරසර ප්‍රේමයෙන් අප ලද වටිනාකම්, සමාජය වෙත දැක්විය යුතු ආකාරය පහත සඳහන් වගුවෙන් තේරුම් ගත හැකි ය.

| | | |
|---|---|---|
| දෙවිඳුන්ගේ තිරසර ප්‍රේමය තුළින් | → | අන් අයට පරිත්‍යාග කළ යුතු ප්‍රේමයේ දීමනා |
| නිරෝගී බව | → | සුවය අපේක්ෂා කරන්නන් සුවපත් කිරීමට පිහිට වීම. |
| පාපයෙන් ආරක්ෂා වීම | → | පාපයෙන් මුදවා ගැනීම |
| වැරදිවලට සමාව | → | වැරදි කරන අයට සමාව දීම |
| අනුකම්පාව හා කරුණාව | → | අසරණ අයට අනුකම්පා කිරීම |
| යහපත තුළින් පූර්ණ සතුට | → | යහපත තුළින් සතුට සෙවීමට යොමු කරවීම |
| යුක්ති ගරුක බව හා සාධාරණත්වය | → | පීඩිත වූවන්ට සාධාරණත්වය ඉටු කිරීම |
| දේව දරුකම | → | සෑම කෙනෙක් ම දේව දරුවන් ලෙස සලකා ගරු කිරීම |

දෙවියන් වහන්සේගේ තිරසර (ස්ථිර) ප්‍රේමය තුළින් ශක්තිමත් වන ඔබ අන් අයගේ ජීවිත නගා සිටුවීමට ඇපකැප වීම වැදගත් වේ. ඒ තුළින් අපට දෙවි පියාණන් අපේක්ෂා කරන යුක්ති ගරුක සාධාරණ ප්‍රේමයේ රාජ්‍යයක් බිහි කිරීමට හැකි වනු ඇත.



**සමිඳුන්ගේ තිර පෙම**
**තමන්ට ගරුබිය පාන**
**අය කෙරෙහි**
**සදා කාලයෙන්**
**සදාකාලයට වේ.**
**ගීතාවලිය 103: 17**

ඉහත බයිබල් පාඨයට අනුව ඔබ දේව ගරුබිය ඇති ජීවිතයක් සඳහා කැඳවා ඇති බව තහවුරු වේ.

## දේව ගරුබිය යනු කුමක් ද?

ශුද්ධ බයිබලයේ ජෝබ් 28:28 ට අනුව දේව ගරුබිය පෑම යනු ප්‍රඥාවේ උල්පත ලෙස පෙන්වා දෙයි. එමගින් ඔබට දේව ගරුබිය ඇති ජීවිතයක් වෙත ගමන් කළ හැකි වේ.

ඔබගේ ජීවිතයට කුඩා කල සිට යහපතට මුල් තැන දෙමින් දෙවි පියාණන් වහන්සේට වඩාත් ළං වූ ජීවිතයක් ගත කිරීමට උත්සාහ කරමු.

## දේව ගරුබිය ඇති ජීවිතයක් ගත කිරීමට ඔබ කළ යුතු දේ කුමක්ද?

දේව පනත්වලට කීකරු වීම.

සෑමවිට යහපතට මුල්තැන දෙමින් ක්‍රියා කිරීම.

ඉරුදින දේව මෙහෙයට සහභාගී වීම.

දිනපතා යාච්ඤාව තුළින් දෙවි පියාණන් සමඟ සම්බන්ධ වීම.

දේව වචනය හැදෑරීම හා මෙනෙහි කිරීම.

ආගමික වතාවත් සඳහා උද්‍යෝගයෙන් සහභාගී වීම.

සමාජය තුළ දේව දරුවකු වශයෙන් ආදර්ශවත් ජීවිතයක් ගත කිරීම.

ඉහත ජීවන රටාව ඇති කර ගැනීම තුළින් දෙවි පියාණන් වහන්සේට ගරුබිය ඇති ජීවිතයක් ගත කිරීමට උත්සාහ කිරීම වැදගත් වේ. එපමණක් නොව ඔබගේ අසල්වැසියාගේ ජීවිතය ද ගෞරවයෙන් පිළිගැනීමට සූදානම් විය යුතු ය. එවිට දෙවියන් වහන්සේගේ ස්ථීර ප්‍රේමය සදහට ම ඔබගේ ජීවිතය තුළ පවතිනු ඇත.

## ක්‍රියාකාරකම

1. ගීතාවලිය 103:1-17 පාඨය තුළින් දෙවියන් වහන්සේගේ තිරසර ප්‍රේමය පිළිබඳ සඳහන් කරුණු ලියන්න.

2. දේව ගරුබිය ඇති ජීවිතයක් ගත කිරීමට ඔබ අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ 04 ක් ලියන්න.